**අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරය - 2013**

-----------------------------------------------------------------

අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2007 ජූලි 17 දිනැති අරමුදල් භාර ඔප්පුවේ 22 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ඉහත මූල්‍ය ප්‍රකාශනයන් අනුව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකාරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශනය

-----------------

## 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 භාර ඔප්පුව සමග අනුකූල නොවීම

---------------------------------------

භාර ඔප්පුවේ 18 වන වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් සෑම මාස 02 කට වරක් භාරකාර මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

3. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------------------

**මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ භාරයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු. 25,904,494 ක ඌනතාවයක් වූ අතර , පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ඌනතාවය රු. 10,586,879 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු. 15,317,615 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර ප්‍රදාන රු.මිලියන 5 ලැබී තිබුණද, යටිතල පහසුකම් නඩත්තු වියදම ආසන්න වශයෙන් රු. මිලියන 20 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට හේතු වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**මූල්‍ය කාර්යසාධනය**

---------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා භාරයේ යටිතල පහසුකම් නඩත්තු වියදම රු.31,706,326 ක් සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.60,120,707 ක් විය. 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සහ පෙර වර්ෂයේ වියදම සහ සමාලෝචිත වර්ෂයේ වියදමෙහි සාරාංශයක් පහත ප්‍රකාශනයෙන් දැක්වේ.

| විස්තරය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| කළුතර මහාධිකරණ කලාපය | 9,274,097 | - | 9,573,970 |
| හම්බන්තොට / මාතර / මහාධිකරණ කලාපය | 4,755,435 | 1,636,205 | 8,109,445 |
| හලාවත / පුත්තලම / මහාධිකරණ කලාපය | 1,252,309 | - | 3,876,077 |
| අධිකරණ ප්‍රවර්ධන භාර අරමුදල් කාර්යාලය | - | - | 209,081 |
| කොළඹ මහාධිකරණ කලාපය | 3,625,827 | 2,828,298 | 11,349,034 |
| කුරුණෑගල මහාධිකරණ කලාපය | 7,677,832 | 1,180,988 | 9,507,787 |
| කෑගල්ල මහාධිකරණ කලාපය | 1,522,900 | - | 3,915,392 |
| ගාල්ල මහාධිකරණ කලාපය | 1,050,000 | - | 1,113,697 |
| අවිස්සාවේල්ල මහාධිකරණ කලාපය | - | - | 372,598 |
| අනුරාධපුර මහාධිකරණ කලාපය | - | - | 760,000 |
| යාපනය මහාධිකරණ කලාපය | 406,000 | - | 406,000 |
| ගම්පහ මහාධිකරණ කලාපය | 1,610,110 | 5,896,495 | 10,395,810 |

| | | | |
|---|---|---|---|
| අධිකරණ සේවා කොමිෂන් සභාවේ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය | 531,816 | - | 531,816 |
| | --------------- | -------------- | -------------------- |
| එකතුව | 31,706,326 | 11,541,986 | 60,120,707 |

5. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

5.1 **සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම**

අරමුදලේ අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් වූ සංයුක්ත සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂයේ සිදු කළ යුතු කාර්යයන් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

5.2 **අයවැය ලේඛනය**

2013 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි

6. **පද්ධති හා පාලනයන්**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

අ) සැලසුම් කිරීම
ආ) අයවැය පාලනය